සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 07 - 2023

## පුරවැසි අධ්‍යාපනය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරන්න.

01. විවිධ සමාජ ආයතනවලට ........................................ බලන විට පවුල සුළු සාමාජික සංඛ්‍යාවකින් සමන්විත වේ.
(නිරපේක්ෂව / සමානව / සාපේක්ෂව)

02. වර්තමාන සමාජය තුළ විවිධ සමාජ ................................ හේතුවල බලපෑම නිසා විස්තෘත පවුල් ඒකක වෙනුවට න්‍යෂ්ටික පවුල් ඒකක සංවිධානය වේ.
(දේශපාලන / ආර්ථික / සංස්කෘතික)

03. දිගු කාලීනව ඉටුකර ගත හැකි ජීවන අරමුණක් වන්නේ ..................................................... වීම ය.
(වෛද්‍යවරයෙක් / ශිෂ්‍ය නායකයෙක් / පංති නායකයෙක්)

04. පුද්ගලයා සතු උසස් ගතිගුණ, උසස් හැසිරීම් රටා පුද්ගලයාට .......................................... ගෙන දෙනු ඇත.
(ආත්මාර්ථකාමී බව / ආත්මාභිමානය / ආත්මාවබෝධය)

05. ක්‍රීඩාවල යෙදීමෙන් පුද්ගලයා තුළ ........................................ අගය කිරීම වර්ධනය වේ.
(ප්‍රචණ්ඩත්වය / ආවේගශීලී බව/ සාධාරණත්වය)

- ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ හරි නම් ( ✓ ) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. ඥාතීන් සමූහයකින් යුක්ත පරම්පරා තුනක් හෝ ඊට වැඩි ගණනක සාමාජිකයන්ගෙන් සමන්විත පවුල් ඒකකය ව්‍යාප්ත පවුල් ඒකකයකි. (............)

07. පුද්ගලයෙකු සුවිශේෂීව හඳුනා ගැනීම සඳහා භාවිත කරනු ලබන්නේ D.N.A ව්‍යුහය පිළිබඳ පරීක්ෂණයයි. (............)

08. හොඳ අධ්‍යාපනයක් ලබා ගැනීම, සමාජ අපකීර්තිය ළඟා කරන්නකි. (............)

09. පුද්ගලයා තුළ යහපත් ගතිගුණ වර්ධනය කිරීම සඳහා පාසලේ ක්‍රියාත්මක විෂය සමගාමී වැඩසටහන් ඉවහල් වේ. (............)

10. නොසන්සුන් මනසින් යුතුව කටයුතු කිරීමෙන් චිත්තවේගීය තත්ත්වයන් පාලනය කරගත හැකිය. (............)

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. ඖෂධ වර්ග භාවිතයේ දී අවධානය යොමු කළ යුතු වැදගත් ම කරුණක් නොවන්නේ මින් කුමක් ද?
    i. රෝගියාට දිය යුතු මාත්‍රා ප්‍රමාණය පිළිබඳව
    ii. කල් ඉකුත්වීමේ දිනය පිළිබඳව
    iii. වෛද්‍ය උපදෙස් පිළිබඳව
    iv. මිලදී ගත යුතු ස්ථානය පිළිබඳව


12. යහපත් සමාජ ජීවිතයක් ගත කිරීම සඳහා යහපත් පුරවැසියකු ලෙස ඔබ තුළ වර්ධනය කර ගත යුතු ගුණාංගයක් වන්නේ,
    i. නිරතුරු අන්‍ය මතවලට විරුද්ධ වීම.
    ii. ස්වයං විනයෙන් යුතුව කටයුතු කිරීම
    iii. ආත්මාර්ථකාමී බව ඇතිකර ගැනීම.
    iv. පොදු දේපළ අයථා ලෙස පරිහරණය කිරීම

13. දරුවා තුළ සමබර පෞරුෂයක් ගොඩනැගීම සඳහා දායක වන සමාජ කණ්ඩායමක් වන්නේ,
    i. ගුරුවරු ය
    ii. ක්‍රීඩකයන් ය.
    iii. හිත මිතුරන් ය.
    iv. ඥාති සමූහයා ය.

14. පුද්ගල අවශ්‍යතා හා සමාජ අවශ්‍යතා සඳහා දත්ත හා තොරතුරු භාවිතයේ දී අප අවධානය යොමු කළ යුතු වැදගත්ම කරුණක් වන්නේ මින් කුමක් ද?
    i. වහලකු සේ තොරතුරු භාවිත කිරීම.
    ii. බුද්ධිමත්ව තොරතුරු භාවිත කිරීම.
    iii. අවිචාරවත් ලෙස තොරතුරු භාවිත කිරීම.
    iv. මංමුලා වූවකු සේ තොරතුරු භාවිත කිරීම.

15. මාධ්‍ය තුළින් ඉදිරිපත් කරන දෛනික තොරතුරු අතරින් අත්‍යවශ්‍යම තොරතුරක් වන්නේ,
    i. ලුහුඬු දැන්වීම්
    ii. වෙළඳ දැන්වීම්
    iii. රාජ්‍ය නිවේදන
    iv. වෙළඳපල මිල ගණන්

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පහත දැක්වෙන පින්තූර ඇසුරින් පිළිතුරු සපයන්න.**



A B

16. ඉහත A හා B පින්තූර වලින් දැක්වෙන පවුල් ප්‍රභේද නම් කරන්න.

    A - ...................................................... B - ......................................................

17. B - පින්තූරයේ දක්නට ලැබෙන පවුල තුළ දැකිය හැකි ලක්ෂණ 2ක් ලියන්න.

    1. ........................................................................................................................................

    2. ........................................................................................................................................



**A**



**B**

18. ඉහත A හා B පින්තූර වලින් දැක්වෙන වතාවත් හා සම්බන්ධ ආගම් නම් කරන්න.

A - ....................................................... B - .......................................................

19. A හා B වලින් දැක්වෙන ආගම්වල ප්‍රධාන ධර්ම ග්‍රන්ථ නම් කරන්න.

A - ....................................................... B - .......................................................

20. ආගමික ස්ථානවල ක්‍රියාත්මක වන වැඩසටහන් වල මූලික අරමුණු 02ක් ලියන්න.

1. ....................................................................................................................................................................

2. ....................................................................................................................................................................

(20 × 2 = ලකුණු 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නයත් තවත් ප්‍රශ්න 4කුත් තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු ලියන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද, ඉතිරි ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද හිමිවේ.

01. i. පවුල තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ 2ක් ලියන්න.

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

(ලකුණු 02)

ii. පවුලේ සාමාජිකයෙක් ලෙස ජීවත් වීමෙන් ලැබෙන ප්‍රයෝජන 3ක් ලියන්න.

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

3. ..........................................................................................................................


(ලකුණු 03)

iii. විවේකය ඵලදායීව ගත කිරීම සඳහා ඔබට නිරතවිය හැකි සෞන්දර්ය ක්‍රියාකාරකම් හා ඒවායින් ලැබෙන ප්‍රයෝජන ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| සෞන්දර්ය ක්‍රියාකාරකම් | එයින් ලැබෙන ප්‍රයෝජන |
|---|---|
| 1. ........................................ | 1. ........................................ |
| 2. ........................................ | 2. ........................................ |
| 3. ........................................ | 3. ........................................ |
| 4. ........................................ | 4. ........................................ |

(ලකුණු 08)

iv.



A B C

ඉහත පින්තූරවලින් දැක්වෙන චිත්තවේගී තත්ත්වයන් නම් කරන්න.

A - ..........................................................................................................................

B - ..........................................................................................................................

C - ..........................................................................................................................

(ලකුණු 03)

02.



A



B



C

i. ඉහත A, B, C පින්තූර වලින් දැක්වෙන රැකියා ක්ෂේත්‍ර නම් කරන්න.

A ..............................................................................................

B ..............................................................................................

A ..............................................................................................

(ලකුණු 03)

ii. "C" වලින් දැක්වෙන රැකියා ක්ෂේත්‍රයට අදාළ රැකියා අවස්ථා 4ක් නම් කරන්න.

1. ............................................ 2. ............................................

3. ............................................ 4. ............................................

(ලකුණු 04)

iii. දෙමාපියන් රැකියාවල නිරතවීම නිසා පවුලේ සාමාජිකයන්ට අත්වන වාසි අවාසි මොනවා ද?

| වාසි | අවාසි |
|---|---|
| 1. ............................................ | 1. ............................................ |
| ............................................ | ............................................ |
| 2. ............................................ | 2. ............................................ |
| ............................................ | ............................................ |

(ලකුණු 04)

03. i. පවුලේ සාමාජිකයෙක් ලෙස ඔබට පවුලෙන් ලැබෙන අයිතිවාසිකම් 3ක් ලියන්න. (ලකුණු 03)

..............................................................................................

..............................................................................................

..............................................................................................

ii. පවුලේ සාමාජිකයෙක් ලෙස ඔබෙන් පවුලට ඉටුවිය යුතු යුතුකම් 4ක් ලියන්න. (ලකුණු 04)

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

iii. ඔබේ පියාගේ හා මවගේ ඥාති පාර්ශව කිහිපයක් පහත දැක්වේ. ඒවා නිවැරදිව නම් කරන්න.

පියාගේ
- → අයියා → ........................................
- → මල්ලී → ........................................
- → අක්කා → ........................................
- → මල්ලිගේ බිරිඳ → ........................................ (ලකුණු 02)

මවගේ
- → අයියා → ........................................
- → අක්කා → ........................................
- → නංගි → ........................................
- → අයියාගේ බිරිඳ → ........................................ (ලකුණු 02)

04. i. ඔබේ පවුල තුළ පවතින සාම්ප්‍රදායන් 3ක් ලියන්න. (ලකුණු 03)

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

ii. පවුල තුළ සම්ප්‍රදායන් අනුගමනය කිරීම නිසා අත්වන ප්‍රයෝජන 3ක් ලියන්න. (ලකුණු 03)

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

iii. ඔබ අසල්වැසියන් සමග සුහදව කටයුතු කරන අවස්ථා 3ක් නම් කරන්න. (ලකුණු 03)

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

iv. අසල්වැසින් සමඟ සුහදව කටයුතු කිරීමෙන් ඔබ ලබා ගන්නා අත්දැකීම් 2ක් ලියන්න. (ලකුණු 02)

........................................................................................................................

........................................................................................................................

05. ඔබේ පවුල ජන සමාජයේ විවිධ ආයතන, සංවිධාන සමග අන්තර් සම්බන්ධතා පවත්වනු ඇත. ඒ ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

i. ඔබේ පවුල නිරතුරු අන්තර් සම්බන්ධතා පවත්වන සමාජ සංවිධාන හෝ ආයතන 3ක් නම් කරන්න. (ලකුණු 03)

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

ii. ඔබ සඳහන් කළ ආයතන තුනෙන් එකක් තෝරාගෙන එයින් ඉටු කෙරෙන කාර්යයන් (සේවා) 4ක් ලියන්න. (ලකුණු 04)

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

iii. ඔබේ පවුල තුළින් එම සංවිධානවලට ඉටු කෙරෙන කාර්යයන් 4ක් ලියන්න. (ලකුණු 04)


.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................


06. i. අයිතිවාසිකම් වල ලක්ෂණ කිහිපයක් දක්නට ලැබේ. ඒ ඇසුරින් පහත සටහනේ හිස්තැන් පුරවන්න.




(ලකුණු 03)

ii. පුද්ගලයා භුක්ති විඳින අයිතිවාසිකම් සිවිල් හා දේශපාලන වශයෙන් ද කොටස් දෙකකට බෙදිය හැකිය. පහත දැක්වෙන අයිතිවාසිකම් එම කොටස් දෙකට නිවැරදිව වර්ග කරන්න.

| | |
|---|---|
| A කැමති ආගමක් ඇදහීම | B ඡන්දය ප්‍රකාශ කිරීම |
| C ඡන්දය ලබාගැනීම | D කැමති ප්‍රදේශයක ජීවත්වීම |




(ලකුණු 04)

iii. ළමයින් ශ්‍රමිකයන් ලෙස සේවයේ යෙදවීම නිසා ඇතිවිය හැකි අයහපත් බලපෑම් 4ක් ලියන්න. (ලකුණු 04)

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

07. i. සමාජය විසින් වැඩිහිටියන් ආරක්ෂා කර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග 2ක් ලියන්න. (ලකුණු 02)

..........................................................................................................................................


..........................................................................................................................................

ii. වර්තමාන ජන සමාජයේ බොහෝ දෙනා මුහුණ දෙන අභියෝගාත්මක අවස්ථා 2ක් ලියන්න. (ලකුණු 02)

..........................................................................................................................................

..........................................................................................................................................

iii.




(ලකුණු 07)

**පහත දැක්වෙන උපකාරක පද ඇසුරින් ඉහත ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.**

හරහට

2. ජන සමාජයේ මෙම සමාජ සංවිධාන දක්නට ලැබේ.
3. මනස සන්සුන් කිරීම සඳහා මේවා කීමට හා ලිවීමට හැකිය.
4. මෙම අයිතිය ලැබීම සිවිල් අයිතිවාසිකමකි.
6. මෙම පූර්වාදර්ශ ලැබීම පවුලේ සාමාජිකයෙක් ලෙස ජීවත් වීමෙන් ලැබෙන ප්‍රයෝජනයකි.

පහළට

1. යහපත් පුරවැසියෙකු ලෙස ජීවත් වීම සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංගයකි.
5. සේවක නීති නිසි ලෙස ක්‍රියාත්මක නොවීමෙන් මෙය සූරාකෑමට ලක් වේ.
7. මේවා ලැබීම වෘත්තිකයන්ගේ අයිතිවාසිකමකි.

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 07 - 2023

# පුරවැසි අධ්‍යාපනය - පිළිතුරු පත්‍රය

### I කොටස

1. සාපේක්ෂව
2. ආර්ථික
3. වෛද්‍යවරයෙක්
4. ආත්මාභිමානය
5. සාධාරණත්වය
6. ✓
7. ✓
8. ×
9. ✓
10. ×
11. iv
12. ii
13. i
14. ii
15. iii
16. A න්‍යෂ්ටික පවුල B විස්තෘත පවුල
17. 1. සාමාජික සංඛ්‍යාව වැඩිය. ශක්තිය වැඩිය.
    2. සෙසු අයගේ ආදරය ආරක්ෂාව උදව් උපකාර ලැබීම (පෙළ පොත 3, 4 පිටු)
18. A. ක්‍රිස්තියානි / කතෝලික B. ඉස්ලාම්
19. A. බයිබලය B. ශුද්ධ වූ කුරාණය/අල්කුරාණය
20. දහම් දැනුම ලබාදීම/පුද්ගලයන් සුමඟට යොමුකිරීම හා යහපතෙහි යෙදවීම.

### II කොටස

1. i. ඥාතීත්වය මත ගොඩනැගී තිබීම/සාමාජිකයන් අතර සමීප සබඳතා පැවතීම (පෙළ පොත 5 පිටුව)
   ii. ආරක්ෂාව ලැබීම / ආදරය සෙනෙහස ලැබීම / අධ්‍යාපනය ලැබීම / පාරම්පරික දැනුම ලැබීම (පෙළපොත 6පිටුව)
   iii. චිත්‍ර ඇඳීම/කවිගායනය/කවි නිර්මාණය/ගීත ගායනය/ගීත නිර්මාණය/නාට්‍ය රචනා/නර්තනය
   ප්‍රයෝජනඃ විනෝදය/වින්දනය/චිත්තවේග පාලනය/චිත්ත වේග සංයමයෙන් ප්‍රකාශ කිරීම (පෙළපොත 22,23 පිටු)
   iv. A සතුට B දුක C බය

2. i. A කෘෂි B ධීවර C සෞඛ්‍ය
   ii. C වෛද්‍ය /හෙද/ගිලන්රථ රියදුරු/ඖෂධවේදීන් ආදී නිවැරදි පිළිතුරුවලට ලකුණු දෙන්න.
   iii. වාසි
   - පවුලේ එදිනෙදා අවශ්‍යතා ඉටුකර ගැනීමට හැකිවීම.
   - ජීවන තත්ත්වය යහපත් ලෙස පවත්වාගෙන යාමට හැකිවීම

   අවාසි
   - දෙමාපිය ආරක්ෂාව රැකවරණය අහිමිවීම.
   - සාමාජිකයන්ගේ රැකවරණය සඳහා බාහිර පුද්ගලයන් යෙදවීමට සිදුවීම. (පෙළපොත 34, 35 පිටු)

3. i. ආහාර හා පෝෂණය/සෞඛ්‍ය පහසුකම්/ඇඳුම් පැළඳුම්/නිවාස පහසුකම්/අධ්‍යාපනය
   ii.
   - උනන්දුවෙන් අධ්‍යාපන කටයුතුවල නිරතවීම.
   - ගුරුවරුන්ට කීකරුවීම
   - නිවසේ දෑ ආරක්ෂා කිරීම
   - බාල සහෝදර සහෝදරියන් රැක බලා ගැනීම.

   (පෙළ පොත 36, 37, 38 පිටු)
   iii. පියාගේ ⟶

| | | |
|---|---|---|
| අයියා | - | මහප්පා |
| මල්ලී | - | බාප්පා |
| අක්කා | - | නැන්දා/නැන්දම්මා |
| මල්ලීගේ බිරිඳ | - | පුංචි අම්මා |

   මවගේ ⟶

| | | |
|---|---|---|
| අයියා | - | මාමා |
| අක්කා | - | ලොකු අම්මා |
| නංගී | - | පුංචි අම්මා |
| අයියාගේ බිරිඳ | - | නැන්දම්මා / නැන්දා |

4. i. • දිනපතා ආගම සිහිකිරීම • පවුලේ සාමාජිකයන් එක්ව ආහාර ගැනීම
   • නිවසින් බැහැර යාමේ දී දෙමාපිය වැඩිහිටියන් නැමද ආශිර්වාද ලබාගැනීම.
ii. • පවුල තුළ සමගිය එකමුතුකම වර්ධනය වීම • ගුණ ධර්ම වලින් යුක්තවීම
   • මව්පිය දූ දරු සබඳතා යහපත්වීම (අදාල නිවැරදි පිළිතුරුවලට ලකුණු දෙන්න.)
iii. ශ්‍රමදාන / පොදු ආගමික කටයුතු / අවමගුල් අවස්ථා / මංගල / දානමය පින්කම් / කුඹුරු වැඩ ආදි නිවැරදි පිළිතුරු වලට ලකුණු දෙන්න.
iv. සහයෝගයෙන් එකමුතුව කටයුතු කිරීමට හැකිවීම, අන් අයගේ අදහස්වලට සවන්දීම, අන්මත ඉවසීම නායකත්වයට ගරු කිරීම (නිවැරදි පිළිතුරුවලට ලකුණු දෙන්න.)

5. i. ආගමික ස්ථාන/මරණාධාර සමිති/යෞවන සමිති/ක්‍රීඩා සමිති (පෙළපොත 52 පිටුව)
ii. දරුවන් ලියා ඇති නිවැරදි අදාල පිළිතුරුවලට ලකුණු දෙන්න. (පෙළපොත 53 පිටුව)
iii. සාමාජික මුදල්/බදු මුදල් ගෙවීම
ඒවාට සහභාගිවීම/භාණ්ඩ උපකරණ සම්පත්
ආරක්ෂා කිරීම ආදී නිවැරදි පිළිතුරු වලට ලකුණු දෙන්න.

6. i. A - සමාජය තුළින් ම හිමිවේ.
B - අසීමිත නොවී පවතියි.
C - යුතුකම් සමඟ බැඳෙයි (පිළිවෙළ වෙනස් වුවද කරුණු තුන ඇත්නම් ලකුණු දෙන්න.)
ii. සිවිල් A, D
දේශපාලන B, C
iii. • කායික මානසික ශක්තිය පිරිහී රෝගී වීම.
• ශ්‍රමය සූරාකෑමට ලක්වීම.
• අපයෝජනයට ලක්වීම.
• ඉගෙනීමට ඇති අවස්ථා අහිමිවීම.
• මත්පැන් මත් ද්‍රව්‍යවලට යොමුවීම. (පෙළපොත 64, 65 පිටු)

7. i. විශ්‍රාම වැටුප් / රක්ෂණ දීමනා / වැඩිහිටි රැකවරණ මධ්‍යස්ථාන (වැඩිහිටි නිවාස) / සෞඛ්‍ය රක්ෂණ ක්‍රම / පිංපඩි
ii. මාධ්‍ය බලපෑම / නූතන විලාසිතා / අපචාර බහුල වීම / ඉහළ යන ජීවන වියදම / නව තාක්ෂණික උපාංග භාවිතය (පෙළ පොත 68, 69 පිටු)
iii.

| හරහට | | පහළට | |
|---|---|---|---|
| 2 | යෞවන | 1 | අවංකබව |
| 3 | කවි | 5 | ශ්‍රමය |
| 4 | ජීවත්වීම | 7 | වැටුප් |
| 6 | යහපත් | | |